සන්නස
SANNASA



# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

## අරමුණක් නැතිව සිටින රටක්

අපේ රට හැමදාමත් ගිනිගන්නා රටකි. ඉතිහාසයේත් එසේමය. දැනුත් එහෙමය. ඉතිහාසයේ අළුදූලි ගසායන්නටත් පෙර නැවත ලෝදිය මතුවන රටකි. එය යුද, බෝම්බ බිය සේම ආර්ථික, සමාජීය, අනාරක්ෂිත ප්‍රශ්නවලින් පිරි ජනතාවගේ හදවත්වලින් බුර බුරා නැගෙන ගිනි කන්දකින් සශ්‍රීක වූ රටකි. අතීතයේ සිට නොයෙක් ජාතීන් බින්න බැසගත් සිංහල, දෙමළ, මුස්ලිම් ලෙසින් බේද බින්න වී එක පොදියේ ගහමරාගන්නා ජාතීන් සැණෙකින් බෙදී වෙන්වන රටකි. කාලයක් දෙමළ සතුරන් මිතුරන් වන, මුස්ලිම් මිතුරන් සතුරන් වන රටකි. අතීතයේ අප මේ සිංහල අපගෙ රටයි ගීත ගයමින් ගහමරා ගත්තෙමු අද වනවට සිංහල දෙමළ මුස්ලිම් කළ්‍යාණ මිතුරනේ ගී ගයමින් අපේ මුනුපුරන් මිනිපිරියන් ගල්මුල්, මුගුරු, කඩු, කිනිසි, රයිපල්, වෙඩිඋණ්ඩ, කාලතුවක්කු සේම මරාගෙන මැරෙන බෝම්බවලින්ද එකිනෙකා මරාගන්නා රටකි. ගායක ගායිකාවන්ගේ මිඩි තරකරගන්නා ගීතවලින් හෝ, සාහිත්‍යය ලිපි ලේඛනයන්ගෙන් හෝ, බයිබලයේ, කුරාණයේ, ත්‍රිපිටකයේ දෙසුම්වලින් හෝ වෙනසක් නොවන, එසේ කළ නොහැකි මුතු ඇටයක් යැයි කියන අමුතු රටකි. අද වන විට අපේ රටේ ජනතාව අලුත් රටක් සොයමින් සිටී. වසර තිහ හතළිහක් පුරා අලුත් රටවල් සොයමින් සිට ලොව පුරා දියුණු නොදියුණු රටවල්වලට රිංගූ ජනතා වට අපද අයත්ය. එක් එක් කාල වකවානු වලදී පුපුරණ බෝම්බ හා වෙඩි උණ්ඩවලට අනුපාතව අප අපේ රට අලුත් නොකර වෙන රටවල් අලුත් කරන අමුත්ම ජාතියකි. අදවනවිට පිටරටවල ජීවත්වන උගතුන් බුද්ධිමතුන් එයට හොඳම සාක්ෂියකි.

"අනේ හාමුදුරුවනේ මේ රට කවදාවත් හදන්න පුළුවන් රටක් නෙමෙයි. කවුරු ආවත් හැමදාම මෙහෙම තමයි. දැන් අපිට ඕනෙ වේලක් හැර වේලක් කාල හරි බයක් නැතිව වැටිල ඉන්න රටක්. අපේ රට දැන් නැහැදිච්ච රටක්. අනේ පාද්‍ර ඇයි අපිට මෙහෙම වුණේ?......."

මරාගෙන මැරුණ අන්තවාදියකුගේ බෝම්බයෙන් මුළු පවුලම අහිමි වූ, ඇයද ආබාධිත වූ මවක් ලෙඩ ඇඳේ සිට ආගමික නායකගෙන් ආරක්ෂිත රටක් එසේ ඉල්ලන අතර, බෝම්බවලට බිය වූ තවත් ජනතාවක් ආරක්ෂිත රටවල් සොයමින් එහේ මෙහේ සැරිසරන්නේ ගොඩගත නොහැකි රටක තව දුරටත් ජීවත්වීමේ ඇති ඵලය කිමදැයි විමසමිනි.

"දැන්නං මේ රටේ ඉන්න බයයි බං. දරුවො දෙන්නයි ගෑනියි නිතරම කෑගහනව කොහේ හරි රටකට පැනගමු කියල"

"උඹල බයවෙන එක සාධාරණයි. හැබයි ඉතින් අපි ඉන්න රටවලත් ඔය විදියටම පුපුරවගන්න එවුන් හැංගිල ඉන්නව. ඒ වුණත් උන්ට අපේ රටේ වගේ ලේසියෙන් පුපුරවගන්න බැරි එක තමයි අපිට තියෙන එකම චාන්ස් එක"

"ඔව් උඹලා ඒ අතින් හරි වාසනාවන්තයො"

"ඔව් පුපුරනකං. වාසනාවන්තකම කොහොම උනත් උඹට හිතෙන්නැද්ද ඇයි එහෙම වෙන්නෙ කියල"

"හිතුව කියල මොනා කරන්නද මචන්. රට වෙනස් වෙන්නැත්තං අපි හරි වෙනස්වෙන්න ඕනෙ"

අප මෙවැනි රටක ජීවත්වෙමින්, අප රටේ අසරණ වූ මිනිසුන්ගේ වියෝව වේදනාව සමග පිළිපන් ආවේග සමග තර්ක කිරීමෙන් ඇති ඵලයක් නැත. ඇත්තේ සවන් දීම පමණි. අපට ඇයි මෙහෙම වුණේ කියා මතුපිටින් හිතන ජනතාව ඉල්ලන අලුත් රට කුමක්ද යන්න තවමත් සිහිනයක් නිසා නිශ්ශබ්ද වෙනවා හැරෙන්නට වෙන කළ හැක්කේ කුමක්ද?. ලැබෙන දේ කුමක් වුවත් අපද ඔවුනද බාරගත යුතුය.

පිරිසක් රට වෙනුවෙන් තද තීන්දු තීරණ ගත හැකි නායකයකු ඉල්ලා සිටිති. ඒ නායකයා යක්ෂයකු හෝ ඒකාධිපතියකු වුවද ඔවුනට කම් නැත. තවත් පිරිසක් සිංහල, බොදු, සෞම්‍ය, පැහැපත් වයස වුවද වයස නොපෙනෙණ, රට ජාතියට ආදරේ ඇති නායකයකු ඉල්ලා කෑ මොර දෙති. රටේ සමහර උගතුන් මෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන සමහර මන්ත්‍රීවරුද ටික කාලයකට හෝ හමුදාවට රට බාරදෙන මෙන් ඉල්ලා හොටු සුරති. ඒ කිසිවකට සවන් නොදෙන යහපාලන නායකයන් දෙදෙනා, තම තමන්ගේ විරසකය මැද්දේ රට යන්නන් වාලේ ඇදගෙන යති.නැත්නම් නාති. මෑත කාලයේ සිංහල, දෙමළ, මුස්ලිම් යන සෑම දේශපාලකයෙක්ම සිතුවේ තමන්ගේ පැවැත්ම හා බලය ලබාගැනීම වෙනුවෙන් රටේ ජනතාව කෙසේ පාවිච්චි කළ යුතුද යන සංකල්පය පමණි. ඔවුන් කිසිදා එක රටක්, එක ජාතියක් ආගමක් යන සංකල්පය තුලින් රට දියුණු කිරීමට අදිතාලම දැමූ නායකයන් නොවේ. සමස්ත ජනතාව සමස්ත දීපයේම ජනතාව යයි නොසිතූ ඔවුහු, සිංහල, දෙමළ, මුස්ලිම් ජාතීන් වශයෙන් වර්ගබේදයට ලක් කරමින් තම ගොඩ වැඩිකරගැනීමට මාන බැලූ අවස්ථාවාදී දේශපාලනඥයන් පමණක්ම වූහ. දැන් අප රටේ සමස්ත ජනතාවක්ම අලුත් රටක් වෙනුවට හිතන්නේ ලොව කොහේ හෝ වෙන රටකි. ඔවුන් තමන්ගේ රට ඇතුලතින්ම අලුත් රටක් මතුකර ගැනීමට කැප නොවෙති. තම ආකල්පයන් නව ලෝකයට සරිලන සේ දියුණු සංකල්ප බවට පත් කරගැනීමට පාලකයන්ට විරුද්ධව ජනතාව පෙළ ගැසෙන්නේ නැත්නම් අපට හැමදාම ජීවත් වන්නට සිදුවන්නේ මෙලෙසිනි.

අතීතයේ එවැනි සංල්කපවලින් පිරි සිංහල දෙමළ මුස්ලිම ජාතියක් අපට සිටියහ. ඒ සියල්ල බෙදා වෙනස් කළේ දේශපාලනයයි. මා කුඩා කල ජීවත් වූයේ කොළඹ ප්‍රදේශයට අයත් මැද කොළඹ ආසනයේය. එකල පැවතියේ කේවල ජන්ද ක්‍රමයකි. මැද කොළඹ ආසනයට මන්ත්‍රීවරු තුන් දෙනෙකු තෝරාගන්නා ඡන්දයේදී ආර් ප්‍රේමදාස, හලීම් ඉසාක්, ජබීර් ඒ කාදර්, පීටර් කෙනමන් ආදී මේ සියල්ලෝම පාර්ලිමේන්තු වට පා තැබුවේ ශ්‍රීලාංකික ජනතාවගේ ඡන්ද වලින් මිස ජාතීන් වශයෙන් වර්ගීකරණය වූ ඡන්දවලින් නොවේ. එසේම සිංහල, දෙමළ, මුස්ලිම් පක්ෂවලින් නොව රටේ ප්‍රධාන ධාරා වේ මුලට සිටින පක්ෂවල අපේක්ෂත්වයෙනි. ඔවුහු පාර්ලිමේන්තුවට පැමිණ ජාති, ආගම්, බේද වාදයකින් තොරව රටට සේවය කළහ. මගේ පියා පීටර් කෙනමන් සහ හලීම් ඉසාක්ට තම සහයෝගය පළ කරන විට මගේ එක් මිතුරකු වූ මොහිදීන්ගේ පියාගේ අනුගාමිකයා වූයේ ආර් ප්‍රේමදාසයි. මගේ පියා සහ මොහිදීන්ගේ පියා ඔවුනොවුන්ගේ අපේක්ෂකයන් වෙනුවෙන් තර්ක විතර්ක කළේ රටට වෙන යහපතක් ගැන සිතමින් විනා, ආගමක් ජාතියක් මුලට ගෙන නොවේ. එකල මගේ පාසලේ එකට අකුරු කළ මුස්ලිම් දෙමළ මිතුරන් බොහෙමයකට මේ යැයි කියා ආගමක් තිබුණේ නැත. මොහිදීන්ලා දයාලන්ලා අප සමග එකට වෙසක් බලා, දන්සැල් වැඳ පාන්දර ජාමයේ ගෙදරට එන සොඳුරු මතකයන් අප හිත් තුළින් කිසිදා නොමියෙයි. සිංහල අවුරුද්දට, නත්තලට, තෛපොන්ගල් උළෙලට, රාමදාන් කාලයට අප සියල්ල ආහාර බඳුන් බෙදාහදාගෙන අනුභව කරන්නේ එක රෑනේ සහෝදර කැළක් මෙනි. ඒ කුඩා අවදියේ මගේ ප්‍රියතම ආහාරය වූයේ මොහිදීන්ගේ නිවසින් රාමදාන් කාලයට ලැබෙන ප්‍රනීත ආහාර හා එළු සුප් බඳුනටයි. මාගේ ප්‍රියතම ආහාර එය බව දන්නා මොහිදීන් ඒ දින කිහිපයේ මා වෙනුවෙන්ම ආහාර වේලක් වෙන් කරතබාගෙන සිටින්නේ ආදරණීය මිතුදමේ බලවත්කම නිසාමය. එසේම අප නිවසට අනෙක් පසින් පිහිටි නිවසේ පදිංචි කරුණාවතී නැන්දා (ඥාතියෙක් නොවූවද අප ඇයව අමතන්නේ නැන්දා ලෙසිනි) විවාහ වී සිටියේ මුස්ලිම් ජාතිකයෙක් වූ සෙයිදීක් මාමා සමගිනි. ඔවුනගේ ලොකු පුතු ගාමිණීද, රමනීතා, ප්‍රේමා හා විනිප්‍රීඩා යන දියණියන් තිදෙනාද, අප සමග එකට එකතුව බුදුන් හා අල්ලා දෙවියන් එකට වැඳපුදාගත් මිතුරු මිතුරියන් වූහ.

මෑත කාලයේ ලංකාවට ගිය විට ඔවුහු බොහෝ දෙනෙක් මා මුණ ගැසෙන්නේ පරණ යාළු මිතුදම් නැවත ස්මරණය කරමිනි. ඔවුනගෙන් සමහරෙක් අද ජීවතුන් අතර නැත. ඔවුනගේ දූ දරුවන්ද මේ වන විට විවාහව සිටින්නේ එකිනෙකට වෙනස් වූ ආගම් හා ජාතීන් සමගිනි. එහෙත් ඒ දූ දරුවන් අප මෙන් ළංව නැත. බොහෝ දුරස්ය. තරගයකට අවතීර්ණව යන්නන් වාලේ දුවති. ඒ අතරතුර මා පිටකොටුවේ ගබෝස් ලේන් සොයා ගියේ ඉතා විරල ආයුර්වේද බෙහෙතක් සොයාගැන්මටය. එහි බොහෝමයක් ආයුර්වේද වෙළඳුන් මුස්ලිම් වරුන්ය. එහෙත් බොහොමයක් ගැනුම්කරුවන් වන්නේ රටපුරා විහිදී සිටින සිංහල ආයුර්වේද වෛද්‍යවරුන්ය.

"දැන් අපේ බිස්නස් හොඳටම බැහැල මහත්තයා. මේ කාලකන්නි සිස්ටම් එක ඇතුලෙ අපි ඔක්කොම නන්නත්තාර වෙලා. හැම දෙනාම ජීවත්වෙන්නෙ බයෙන් සැකෙන්. වෙද මහත්තුරු වුනත් අපෙන් දැන් බඩුගන්න බයයි. අපේ නම විතරයි මුස්ලිම් මහත්තයා. එහෙම නමක් නැත්තං අපිත් සිංහල තමයි." ඔහු එලෙස තම දුක්ගැනවිල්ල මා සමග පැවසුවේ "කොහොමද බිස්නස් සරුද" කියා මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් ලෙසිනි.

ජාතිබේදවාදයකු මුලින්ම නසන්නේ තම ජාතියයි. අන්ත ආගම්වාදියකු මුලින්ම නසන්නේ තම ආගමයි. මගේ දේශය, මගේ ජාතිය, මගේ ආගම ඇත්තෙන්ම මට ලබාදුන් ත්‍යාගයක්ද?. එසේම චණ්ඩ මාරුතයක වුවද නොසෙල්වෙන නිවහල් චින්තනයක් අපට හිමිද?. එසේනම් එය කෙසේ අර්ථකථනය කරගත යුතුද?. එසේම අපට අවශය කරන අලුත් රටට වඩා පරණ රටට අප තවමත් ආදරය කරන්නේ ඇයි?. මිතුර... අලුත් රටක් ගැන කතාකරන ගමන් පරණ රට ගැනත් මඳකට හිතන්න.

## විනී හෙට්ටිගොඩ

